## 2023 වර්ෂය සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල රැස්වීම - 2022.10.27

## මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල රැස්වීම 2022.10.27 දින පෙ.ව. 09.30 ට භාණ්ඩාගාර නව ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරයේදී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

ස්ථාන මාරු මණ්ඩලය :

**ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය** - සභාපති
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

**කේ. සත්‍යකුමාර් මයා** - සාමාජික
අධ්‍යක්ෂ

**එන්.කේ.එස්. චන්ද්‍රසේකර මයා** - සාමාජික
සහකාර අධ්‍යක්ෂ

වෘත්තිය සමිති නියෝජිතයින් :

I. කේ.එස්.කේ. ශ්‍රේරු මහතා - ප්‍රධාන භාණ්ඩාගාරික
සමස්ත ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර සංගමය

II. කේ.ජී.ආර්.පී. සෙනෙවිරත්න මහතා - විධායක නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරීන්ගේ වෘත්තීය සමිති සම්මේලනය

III. කේ.ජී. අතුල මහතා - භාණ්ඩාගාරික
රාජ්‍ය සේවා කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ සංගමය

IV. කේ.ඩී.සී.එස්.කේ. රත්නසේකර මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම්
රජයේ කළමනාකරණ සේවා නිලධාරි සංගමය

V. පී.ජී. සමන් පීරිස් මහතා - ප්‍රධාන ලේකම්
සමස්ත ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ සංගමය

02. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සහ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් විසින් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබාදෙන ලෙස අභියාචනා 08ක් ද, නිලධාරීන්ගේ අත්සනින් යුත් පෙත්සම් 02ක්ද ඉදිරිපත්කොට ඇත. නමුත් 2023 අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩල රැස්වීමේදී තීරණය කළ පරිදි එම දෙපාර්තමේන්තු හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මෙම අමාත්‍යාංශය යටතේ පැවති කාලසීමාවලදී අනුයුක්ත කරන ලද නිලධාරීන්ට පමණක් ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරුවීමේ අවස්ථාව ලබාදීමට ගත් තීරණයේ වෙනසක් නොවන බව අභියාචනා මණ්ඩලය විසින් දන්වන ලදී.

03. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ආර්.ඩබ්.එස්.ආර්. රාජසේකර මිය විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවක් ඉල්ලා ඇති අතර එම ඉල්ලීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකිරීමට තීරණය විය.

04. තවද පහත නම් සඳහන් නිලධාරීන් විසින් වයස අවු. 55 සම්පූර්ණ කිරීම මත කඩිනමින් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුකරන ලෙස දන්වමින් ආයතන ප්‍රධානීන් මගින් අභියාචනා ඉදිරිපත්කොට ඇත. එම අභියාචනා පිළිබඳව සලකාබැලිය නොහැකි බවත්, 10.2 පදනම යටතේ ඔවුන් වෙත ලබාදී ඇති වරප්‍රසාදය ඔවුන් මෙම අමාත්‍යාංශයට පැමිණි දිනය අනුව හා මෙම අමාත්‍යාංශයේ සපුරා ඇති සේවා කාලය අනුව හිමිවන බවත් අභියාචනා මණ්ඩලය විසින් දන්වන ලදී.

1. ජී.එල්. සුනිල් ශාන්ත මහතා - තක්සේරු
2. එස්.ආර්. විදානගේ මිය - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
3. එම්.ඒ.ජී. තුෂාරි මිය - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
4. යූ.ඩී.ඩබ්. කුලරත්න මිය - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
5. ජී.ඒ.ටී.කේ. පෙරේරා මයා - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

05. තවද තක්සේරු දෙපාර්තමේන්තුවේ මහනුවර කාර්යාලයට අනුයුක්තව සේවයේ නියුතු ඒ.එම්.ජී. අධිකාරී මිය විසින් 10.2 අනුපාතය යටතේ 2023 වර්ෂයේදී තමාට රේගුව වෙත ලැබී තිබූ ස්ථාන මාරුව අවලංගුකොට මහනුවර සුරාබදු කාර්යාලයට ස්ථාන මාරුව ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව ඇය 2023.01.02 සිට මහනුවර සුරාබදු කාර්යාලය වෙත විධිමත්ව මුදාහරින ලෙස ආයතන ප්‍රධානී වෙත දන්වන ලදී. නමුත් නැවත ඇයට රේගුව වෙත ස්ථාන මාරුව ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත්කොට ඇත. මේ වනවිට ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල පවත්වා අවසන්කොට ඇති බැවින්, රේගු දෙපාර්තමේන්තුවේ අතිරේකව පුරප්පාඩුවක් ඇතිවන්නේ නම් ඒ සඳහා 2023.03.01 දින සිට නිලධාරිනිය රේගුව වෙත ස්ථාන මාරුකිරීමට තීරණය විය.

06. ඉහත අංක 05හි පරිදි අධිකාරී මහත්මිය රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලබන්නේ නම් මීළඟට මහනුවර සුරාබදු කාර්යාලය වෙත ස්ථාන මාරුවක් ඉල්ලා අභියාචනයක් ඉදිරිපත්කොට ඇති මහනුවර තක්සේරු දෙපාර්තමේන්තුවේ ආර්.ටී.කේ. විදුරුසිංහ මියට එම අවස්ථාව ලබාදීමට තීරණය විය.

| | | |
|---|---|---|
| ............................... | ............................... | ............................... |
| **ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය**<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>(සභාපති)<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ<br>ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | **කේ. සත්‍යකුමාර් මයා**<br>අධ්‍යක්ෂ<br>(සාමාජික)<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ<br>ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | **එන්.කේ.එස්. චන්ද්‍රසේකර මයා**<br>සහකාර අධ්‍යක්ෂ<br>(සාමාජික)<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ<br>ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |

ඩී. එච්. එස්. පුල්ලපෙරුම
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

කේ. සත්‍යකුමාර්
අධ්‍යක්ෂ
ආයතනික කටයුතු අංශය
මුදල් අමාත්‍යාංශය

එන්.කේ. සමන් චන්ද්‍රසේකර
සහකාර අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01.